# - ජාතික මුද්දර ප්‍රදර්ශනය 2017 -

**දිනයන් සහ වේලාවන් -**

1 - 2017 ඔක්තෝබර් 25 - පෙරවරු 10-00 සිට පස්වරු 8-00 දක්වා.
2 - 2017 ඔක්තෝබර් 26 - පෙරවරු 9-00 සිට පස්වරු 8-00 දක්වා.
3 - 2017 ඔක්තෝබර් 27 - පෙරවරු 9-00 සිට පස්වරු 8-00 දක්වා.
4 - 2017 ඔක්තෝබර් 28 - පෙරවරු 9-00 සිට පස්වරු 8-00 දක්වා.
5 - 2017 ඔක්තෝබර් 29 - පෙරවරු 9-00 සිට පස්වරු 8-00 දක්වා.

**ස්ථානය -**

තැපැල් මූලස්ථානය, 310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.

**සංවිධානය -**

තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය සමග ජාත්‍යන්තර මුද්දර ෆෙඩරේෂණයේ (FIP) සහ අන්තර් ආසියානු මුද්දර ෆෙඩරේෂණයේ (FIAP) සාමාජිකත්වය දරන ශ්‍රී ලංකා මුද්දර එකතු කරන්නන්ගේ සංගමය .

**සහභාගිත්වය සඳහා කොන්දේසි -**

1 - මීට පෙර අවස්ථාවලදී මුද්දර කාර්යාංශය මගින් හෝ ශ්‍රී ලංකා මුද්දර එකතුකරන්නන්ගේ සංගමය මගින් හෝ එකී පාර්ශවයන් ඒකාබද්ධව හෝ පවත්වන ලද මුද්දර ප්‍රදර්ශන සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශක නැවත ඉදිරිපත් නොකල යුතුය.

2 - තරගකාරී අංශය සඳහා එක් පුද්ගලයෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් ප්‍රදර්ශකයක් පමණකි. තරගකාරී නොවන අංශය සඳහා එක් පුද්ගලයෙකුට ප්‍රදර්ශක ඕනෑම ප්‍රමාණයක් ඉදිරිපත් කල හැකිය.

**ප්‍රදර්ශන අංශයන් -**

1 - තරගකාරී අංශය.

මෙම අංශයෙන් ලැබෙන ප්‍රදර්ශක සඳහා එක් එක් කාණ්ඩ යටතේ ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන ලබාගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන්ට පිළිවෙලින් රන්, රිදී සහ ලෝකඩ පදක්කම්ද වටිනා ත්‍යාග සහ සහතිකපත්‍ද හිමිවේ. පදක්කම් සඳහා අවම වශයෙන් ලකුණු 80ක්ද අනෙකුත් ත්‍යාග සඳහා අවම වශයෙන් ලකුණු 60ක්ද සහභාගිත්ව සහතික සඳහා අවම වශයෙන් ලකුණු 40ක්ද ලබාගෙන තිබිය යුතුය.

2 - තරගකාරී නොවන අංශය.

මෙම අංශයෙන් ලැබෙන ප්‍රදර්ශක ඉදිරිපත් කරනු ලබන්නේ ප්‍රදර්ශනය සඳහා පමණකි. නියමිත ප්‍රමිතියෙන් යුක්ත ප්‍රදර්ශක සඳහා පමණක් සහභාගිත්ව සහතික හිමිවන අතර ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසුද යන්න පිළිබඳ තීරණය, විනිශ්චය මණ්ඩලය සතු වේ.

**වයස් කාණ්ඩ සහ ප්‍රදර්ශක පිටු ගණන -**

පහත සඳහන් වයස් කාණ්ඩයන් යටතේ තරගකාරී සහ තරගකාරී නොවන අංශයන්ගෙන් ප්‍රදර්ශක ඉදිරිපත් කළ හැකිය.

| | වයස් කාණ්ඩය | පිටු ගණන | ඉදිරිපත් විය හැකි තරග කාණ්ඩ (Classes of Philately) |
|---|---|---|---|
| 1 | 5, 6, 7 ශ්‍රේණි | පිටු 04 | සාම්ප්‍රදායික / තේමාත්මක |
| 2 | 8, 9, 10 ශ්‍රේණි | පිටු 08 | සාම්ප්‍රදායික / තේමාත්මක |
| 3 | 11, 12, 13 ශ්‍රේණි | පිටු 16 | සාම්ප්‍රදායික / තේමාත්මක |
| 4 | වැඩිහිටි | පිටු 16 හෝ 32 | සාම්ප්‍රදායික / තේමාත්මක /තැපැල් ඉතිහාසය / තැපැල් ලිපිද්‍රව්‍ය / ගුවන් තැපැල් / තාරකා විද්‍යාව / ආදායම් |

**ප්‍රදර්ශනපත් -**

ප්‍රදර්ශනපත් වශයෙන් A4 ප්‍රමාණයේ සුදු ඡායා පිටපත් කඩදාසි භාවිතා කළ හැකි අතර අවශ්‍යනම් ඒ සඳහාම විශේෂයෙන් සකසන ලද පත්‍රිකා, මුද්දර කාර්යාංශයෙන් මිළදී ගැනීමට හෝ තැපෑලෙන් ගෙන්වා ගැනීමට පුළුවන.

ප්‍රදර්ශනපත් සහ ඒවා බහාලන විනිවිද පෙනෙන රක්ෂිත ආවරණ කට්ටල වල මිළ ගණන් පහත පරිදි වේ.

| | වයස් කාණ්ඩය | පිටු ගණන | මිළ |
|---|---|---|---|
| 1 | 5, 6, 7 ශ්‍රේණි | පිටු 04 | රු. 100.00 |
| 2 | 8, 9, 10 ශ්‍රේණි | පිටු 08 | රු. 200.00 |
| 3 | 11, 12, 13 ශ්‍රේණි | පිටු 16 | රු. 400.00 |
| 4 | වැඩිහිටි | පිටු 16 | රු. 400.00 |
| 5 | වැඩිහිටි | පිටු 32 | රු. 800.00 |

අවශ්‍ය කට්ටලය (පිටු ගණන) සඳහන් කරන ලද ලිපියක්, විද්‍යුත් මුදල් ඇණවුමක් සමග එවීමෙන් මේවා ලබා ගත හැකි අතර අවශ්‍යනම් අමතර පිටුද මිළදී ගත හැකිය. අමතර ප්‍රදර්ශනපතක් සහ සෙලෝපේන් ආවරණයක් සඳහා රු. 25.00ක මුදලක් අයකරනු ලැබේ.

ප්‍රදර්ශනපත් සහ සෙලෝපේන් ආවරණ මිළදී ගැනීම සඳහා එවනු ලබන මුදල් ඇණවුමේ, ගෙවීම ලබන්නා **පෝස්ට් මාස්ටර් ජනරාල්** ලෙසද ගෙවන කාර්යාලය **මූලස්ථාන තැපැල් කාර්යාලය** ලෙසද සඳහන් කර **අධ්‍යක්ෂ, මුද්දර කාර්යාංශය, තැපැල් මූලස්ථානය, 310, ඩී. ආර්. විජේවර්ධන මාවත , කොළඹ 10** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන්න.

සකස් කරන ලද සියළු ප්‍රදර්ශක 2017-10-14 දින හෝ ඊට පෙර ලැබෙන සේ විශාල ප්‍රමාණයේ ඝණකම් කවරයක බහා ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවීම හෝ ගෙනැවිත් භාරදීම කල යුතුය.

**අධ්‍යක්ෂ,**
**මුද්දර කාර්යාංශය,**
**තැපැල් මූලස්ථානය,**
**310, ඩී. ආර්. විජේවර්ධන මාවත ,**
**කොළඹ 10.**

**<u>ප්‍රදර්ශනය කළ හැකි දෑ -</u>**

මුද්දර හා මුද්දර ආශ්‍රිත අයිතමයන් පමණක් ප්‍රදර්ශනය කළ හැකිය. මුද්දර හා සම්බන්ධතාවයක් නොමැති කාසි හා නෝට්ටු ප්‍රදර්ශනය කළ නොහැකිය.

<u>තරඟ කාණ්ඩ (Classes of Philately) -</u>

<u>1 - සාම්ප්‍රදායික (Traditional Philately) -</u>

මුද්දර, සිහිවටන පත්‍රිකා, මුල් දින කවර එකතු කිරීමත් තැපැල් කාර්යාලයෙන් මිළදී ගැනීමට හැකියාවක් නොමැති මුද්දර සඳහා අඳින ලද චිත්‍ර, සෝදුපත් ආදිය එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

<u>2 - තේමාත්මක (Thematic Philately) -</u>

තේමාවකට අදාල වන මුද්දර සහ අනෙකුත් ඕනෑම තැපැල් ලිපිද්‍රව්‍යයන් එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

<u>3 - තැපැල් ඉතිහාසය (Postal History) -</u>

තැපෑලේ ඉතිහාසයට අදාල වන, තැපැල් ගාස්තු සහ තැපැල් ප්‍රවාහන මාර්ග පිළිබඳ සාක්ෂි සපයන මුද්දර සහ අනෙකුත් තැපැල් ලිපි ද්‍රව්‍යයන්ද දින මුද්‍රා සළකුණුද එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

<u>4 - තැපැල් ලිපිද්‍රව්‍ය (Postal Stationery) -</u>

මුද්දර මුද්‍රිත ලිපි කවර, තැපැල්පත්, ගුවන් ලිපි, මුද්දර අලවා භාවිතා කරන ලද ලිපි කවර, තැපෑලට භාවිතා කර ඇති පුවත්පත් හා පාර්සල් දවටන ආදිය එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

<u>5 - ගුවන් තැපැල් (Aerophilately) -</u>

ගුවන් තැපෑල සඳහා විශේෂයෙන් භාවිතා කරන ලද මුද්දර, ගුවන් තැපෑලෙන් යවන ලද තැපැල්පත්, මුද්දර ඇලවූ කවර සහ ගුවන් තැපෑලට භාවිතා කරන ලද ලේබල් ආදිය එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

<u>6 - තාරකා විද්‍යාව (Astrophilately) -</u>

තාරකා විද්‍යාව ආශ්‍රිත තේමාවන්ගෙන් නිකුත් කර ඇති මුද්දර මෙන්ම අනෙකුත් ඕනෑම තැපැල් ලිපිද්‍රව්‍යයන් එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

<u>7 - ආදායම් (Revenue) -</u>

ආදායම් මුද්දර එකතු කිරීමත් ඒවා පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙයට අදාල වේ.

**<u>මුද්දර ප්‍රදර්ශකය -</u>**

මුද්දර ප්‍රදර්ශකයක් යනු කිසියම් කාණ්ඩයක් (Class of Philately) යටතේ එකතු කර ඇති මුද්දර සහ ආශ්‍රිත අයිතමයන් ක්‍රමානුකූලව පිළිවෙලකට ඉදිරිපත් කර, ප්‍රදර්ශනය සඳහා සකස් කර ඇති ප්‍රදර්ශකයකි. තේමාවට අදාලව සම්පූර්ණවූත් නිවැරදි තොරතුරු වලින් පරිපූර්ණවූත් විස්තරයක් මෙහි ඉදිරිපත් කර තිබිය යුතුය. මෙහි සඳහන් විස්තරය සම්පූර්ණයෙන් ම වචනවලින් ඉදිරිපත් කර නොතිබිය යුතු අතර ඒ සඳහා මුද්දර සහ ආශ්‍රිත අයිතමයන් භාවිතා කර තිබිය යුතුය. අවශ්‍ය තැන්වලදී පමණක් ඉතාම කෙටියෙන් වචනවලින් පැහැදිලි කිරීම් කල යුතුය.

මුද්දර ප්‍රදර්ශකයක් සැකසීමේදී අදාල තේමාව තෝරාගැනීම පිළිබඳ සම්පූර්ණ නිදහස තරඟකරුට හිමිවේ.

මේ පිළිබඳව වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා සකස් කරන ලද පිටු 8කින් යුත් ආදර්ශ ප්‍රදර්ශකයක් මේ සමග ඇත.

**<u>ප්‍රදර්ශකයක් සකස් කිරීමේදී භාවිතා කලහැකි අයිතමයන්</u>**

1- මුද්දර (stamps), මුද්දර පොත් පිංච (stamp booklets), තැපැල් ලිපි ද්‍රව්‍යයන් (postal stationeries) - *(මුද්දර මුද්‍රිත ලිපි කවර (pre stamped envelopes), තැපැල්පත් (postcards), ගුවන් ලිපි (aerogrammes), විසිතුරු තැපැල්පත් (maximum cards))* යාන්ත්‍රික තැපැල් මුද්‍රා ( metres franking ), පරිඝණක මුද්‍රිත ලේබල් (computer vended postage), අති මුද්‍රිත මුද්දර (overprints & surcharges) සහ සිදුරු විදින ලද මුද්දර (perfins).
2- සාමාන්‍ය දින මුද්‍රා (postmarks), විශේෂ දින මුද්‍රා, සමරු දින මුද්‍රා සහ උද්‍යෝග පාඨ (slogan cancellations).
3- ජාත්‍යන්තර පිළිතුරු කූපන් පත්, ලියාපදිංචි ලේබල් සහ වෙනත් තැපැල් ලේබල්.
4- මුද්දර සහ මුද්දර ආශ්‍රිත අයිතමයන්ගේ කටුසටහන් (Sketches) සහ සෝදුපත් (Proofs) ආදිය.
5- මුද්‍රණ දෝෂ සහිත අයිතමයන් (Varieties).
6- මුද්දර හඳුන්වා දීමට පෙර භාවිතා කල තැපැල් ලිපි ද්‍රව්‍යයන්.

**<u>ප්‍රදර්ශකයන් සකස් කිරීමේදී භාවිතා නොකලයුතු අයිතමයන්</u>**

1- රටවල්වල නම් වශයෙන් ව්‍යාජ නම් සඳහන් මුද්දර හා ආශ්‍රිත අයිතමයන්.
2- තැපැල් සේවාවන් ක්‍රියාත්මක නොවන රටවල නම් සහිත මුද්දර හා ආශ්‍රිත අයිතමයන්.
3- තැපැල් සේවාවන් විසින් නිකුත් නොකල පින්තූර තැපැල්පත්.
4- තැපැල් ලිපි ද්‍රව්‍යයන් මත මුද්‍රිත පුද්ගලික තොරතුරු, සැරසිලි හා වෙළෙඳ දැන්වීම් සහිත අයිතමයන්.
5- මුද්දර ආශ්‍රිත පින්තූර, ඡායාපිටපත් ආදිය.

**ප්‍රදර්ශකය සැකසීම -**

ප්‍රදර්ශකය සැකසීමේදී අනුගමනය කලයුතු පොදු රීතීන් කීපයක් ඇත.

1- ප්‍රදර්ශකය සකස් කිරීම සඳහා යොදාගනු ලබන සිරස් හැඩැති පිටුවල ප්‍රමාණය මි.මී 215 x මි.මී 295 වේ. (A4 ප්‍රමාණයේ සුදු ඡායා පිටපත් කඩදාසිද මේ සඳහා භාවිතා කළ හැකිය.)

2- ප්‍රදර්ශකයක පිටු වල වර්ණය සුදු හෝ ලා පැහැයක් වියයුතුය.

3- සෑම පිටුවක්ම අංකනය කල යුතු අතර සෑම පිටුවකම පසුපස ප්‍රදර්ශකගේ නම, ලිපිනය, දුරකතන අංක ආදී විස්තර සඳහන් කිරීම කල යුතුය.

4- ප්‍රදර්ශක පිටු වල මුද්දර හෝ මුද්දර ආශ්‍රිත අයිතමයන් රැඳවිය යුත්තේ හින්ජස් හෝ මුද්දර රැඳවුම් පටි ආධාරයෙනි. පාවිච්චි නොකල මුද්දර ආශ්‍රිත අයිතමයන් රැඳවීම සඳහා මුද්දර රැඳවුම් පටි භාවිතය වඩාත් යෝග්‍ය වේ.

5- අවසානයේදී ප්‍රදර්ශකයේ සෑම පිටුවක්ම අම්ලහරණය කරන ලද විනිවිද පෙනෙන ඇසුරුමක බහා විවෘතව ඇති කෙළවර වැසිය යුතුය.

ප්‍රදර්ශකයකින් කෙරෙනුයේ තෝරාගත් තේමාවක් පිළිබඳව පුළුල් විග්‍රහයක් මුද්දර සහ ආශ්‍රිත අයිතමයන් ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමය. මෙහිදී තේමාවට අදාල කරුණු කිසියම් පිළිවෙළකට පෙළගැස්විය යුතු අතර ප්‍රදර්ශකයේ මුල් පිටුවේ තේමාව පිළිබඳව කෙටි හැඳින්වීමක් සමග ප්‍රදර්ශකයේ සැලැස්ම, මාතෘකා සහ උප මාතෘකා වශයෙන් ඊට අදාල පිටු අංක සඳහන් කරමින් පොතක පටුනසේ ඉදිරිපත් කල යුතුය.

**ප්‍රදර්ශක ඇගයීමේ නිර්නායකයන් සහ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය -**

ප්‍රදර්ශකයක් ඇගයීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් නිර්ණායකයන් කිහිපයක් ඇති අතර ඒ අනුව යමින් මෙම ප්‍රදර්ශනයට අදාලව සකස් කරන ලද ලකුණු ලබා දීමේ ක්‍රමවේදය පහත දක්වා ඇත.

| නිර්ණායකය | | වයස් කාණ්ඩය අනුව ලැබෙන ලකුණු | | | |
|---|---|---|---|---|---|
| | | 5, 6, 7 ශ්‍රේණි | 8, 9, 10 ශ්‍රේණි | 11, 12, 13 ශ්‍රේණි | වැඩිහිටි |
| 01 | තේමාවේ කරුණු ඉදිරිපත් කිරීම. (Treatment)<br>තේමාව සහ සැළැස්ම (Title and Plan)<br>තේමාව ගොඩනැංවීම (Development)<br>නව අදහස් (Innovation) | 20 | 24 | 28 | 32 |
| 02 | දැනුම සහ අධ්‍යයනය<br>(Knowledge, Personal Study and Research))<br>තේමාවට අදාල (Thematic)<br>මුද්දර විනෝදාංශයට අදාල (Philatelic) | 15 | 16 | 22 | 28 |
| 03 | ස්වභාවය සහ විරළ බව (Condition and Rarity) | 20 | 25 | 25 | 25 |
| 04 | ඉදිරිපත් කිරීම (Presentation) | 45 | 35 | 25 | 15 |

**ත්‍යාග සටහන -**

| කාණ්ඩය | ස්ථානය | පදක්කම් | මුදල් ත්‍යාග | සටාවර ඇනවුම් ගිණුම් ත්‍යාග |
|---|---|---|---|---|
| 5, 6, 7 ශ්‍රේණි | පළමුවන | රන් | රු. 10,000.00 | රු. 2,000.00 |
| | දෙවන | රිදී | රු. 7,500.00 | රු. 2,000.00 |
| | තෙවන | ලෝකඩ | රු. 5,000.00 | රු. 2,000.00 |
| 8, 9, 10 ශ්‍රේණි | පළමුවන | රන් | රු. 15,000.00 | රු. 2,000.00 |
| | දෙවන | රිදී | රු. 10,000.00 | රු. 2,000.00 |
| | තෙවන | ලෝකඩ | රු. 7,500.00 | රු. 2,000.00 |
| 11, 12, 13 ශ්‍රේණි | පළමුවන | රන් | රු. 20,000.00 | රු. 2,000.00 |
| | දෙවන | රිදී | රු. 15,000.00 | රු. 2,000.00 |
| | තෙවන | ලෝකඩ | රු. 10,000.00 | රු. 2,000.00 |
| වැඩිහිටි | පළමුවන | රන් | රු. 20,000.00 | රු. 2,000.00 |
| | දෙවන | රිදී | රු. 15,000.00 | රු. 2,000.00 |
| | තෙවන | ලෝකඩ | රු. 10,000.00 | රු. 2,000.00 |

**ත්‍යාග සඳහා සුදුසුකම් ලැබීම -**

- **පදක්කම්** - ප්‍රදර්ශකය සඳහා ඒ ඒ කාණ්ඩය යටතේ අවම වශයෙන් ලකුණු 80ක් ලැබිය යුතුය.
- **මුදල් ත්‍යාග** - ප්‍රදර්ශකය සඳහා ඒ ඒ කාණ්ඩය යටතේ අවම වශයෙන් ලකුණු 60ක් ලැබිය යුතුය.
- **සහභාගීත්ව සහතික-** ප්‍රදර්ශකය සඳහා ඒ ඒ කාණ්ඩය යටතේ අවම වශයෙන් ලකුණු 40ක් ලැබිය යුතුය.

ප්‍රදර්ශක සැකසීමට උපදෙස්

1. තේමාවේ කරුණු ඉදිරිපත් කිරීම -

- තේමාවට අදාල සෑම පැතිකඩක්ම සාකච්ඡා කල යුතුය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව යන තේමාව තෝරාගතහොත්, එහි ඉතිහාසය, විවිධ යුගයන්ගේ චිත්‍ර කලාවේ සුවිශේෂී ලක්ෂණ, වර්තමානය තෙක් විකාශනය ආදී වශයෙන් පුළුල්ලෙස සාකච්ඡා කල යුතුය.

- ශාක, සතුන්, ක්‍රීඩා වැනි අසීමිත ලෙස පුළුල් පරාසයක විහිදෙන තේමාවන් තෝරා ගැනීම නොකලයුතුය.

- "මුද්දරයෙන් නිරූපිත සංගීත භාණ්ඩ" වැනි තේමාවන් තෝරා නොගත යුතුය. මන්ද ප්‍රධාන තේමාව, මුද්දරයෙන් නිරූපිත යන රාමුවට කොටු වීමෙන් පුළුල් සාකච්ඡාවකට භාජනය කිරීමේ හැකියාවක් නොමැති වන බැවිනි .

- තේමාව, මාතෘකා සහ උප මාතෘකා වශයෙන් ක්‍රමානුකූලව සැළසුම් කල යුතුය.

- සෑම මාතෘකාවකම සහ උප මාතෘකාවකම සඳහන් කරුණු තුලනාත්මකව ඉදිරිපත් කල යුතුය. එනම් එක් මාතෘකාවක විස්තර පිටු භාගයක ඉදිරිපත් කර තවත් මාතෘකාවක විස්තර පිටු 2ක් පුරාවට ඉදිරිපත් කිරීම වැනි දෑ නොකල යුතුය.

- මාතෘකා ඉදිරිපත් කිරීමේදී අනු පිළිවෙලක් අනුගමනය කර තිබිය යුතුය. එනම් මාතෘකාවක විස්තර පිටු 02ක් පුරාවට ඉදිරිපත් කිරීම වැනිදෑ නොකල යුතුය.

- මාතෘකා ඉදිරිපත් කිරීමේදී අනුපිළිවෙලක් අනුගමනයකර තිබිය යුතුය. උදාහරණයක් වශයෙන් දක්වතොත් 'ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාව' යන තේමාවට අදාලව ප්‍රදර්ශකයක් සකස් කරන්නේනම් 'අනුරාධපුර යුගයේ චිත්‍ර කලාව' යන මාතෘකාවට පසුව 'මහනුවර යුගයේ චිත්‍ර කලාව' යන මාතෘකාව විග්‍රහ කර තිබිය යුතුය.

- තේමාවට අදාල නව අරුත් සැපයීම, නව පැතිකඩ වලින් තේමාව දෙස බැලීම සහ නව්‍ය අයිතමයන් තේමාවට අදාලව ඉදිරිපත් කිරීම කල යුතුය.

2 දැනුම සහ අධ්‍යයනය -

- තේමාවට අදාල කරුණු පැහැදිලි කිරීමේදී විස්තර ලිවීම ඉතා කෙටියෙන් කල යුතු අතර රඳවනු ලබන මුද්දර හා ආශ්‍රිත අයිතමයන් තුලින් ම කරුණු පැහැදිලි වීමට ඉඩ සැලැස්විය යුතුය.

- කරුණු ඉදිරිපත් කිරීමේදී, අදාල තැන්වල විද්‍යාත්මක නාමයන්, තාක්ෂණික නාමයන් ආදිය ඉතා නිවැරදිව සඳහන් කල යුතුය.

- විග්‍රහ කරන කරුණට අදාල ඉතා නිවැරදි අයිතමය, නියමිත ස්ථානයේ රැඳවීම කල යුතුය. උදාහරණයක් ලෙස දක්වතොත් ඩීසල් දුම්රිය පිළිබඳව පැහැදිලි කිරීමේදී ගල් අඟුරු දුම්රිය නිරූපිත මුද්දර භාවිතා නොකල යුතුය.

- මුද්දර විනෝදාංශය පිළිබඳව ඇති දැනුම ප්‍රදර්ශනය කල යුතුය. එනම් මුද්දර වල සිදුරු විදුමන්, දිය සළකුණු, මුද්‍රණ ක්‍රම, තැපැල් ගාස්තු ආදිය අනුව තේමාවට ගැලපෙන පරිදි මුද්දර හා ආශ්‍රිත අයිතමයන් ප්‍රදර්ශකය තුල ප්‍රදර්ශනය කල යුතුය.

3 ස්වභාවය සහ විරල බව -

- සියළු මුද්දර ආශ්‍රිත අයිතමයන් ඉතා හොඳ තත්වයේ පිරිසිදු ඒවා විය යුතුය.
- ඉරුණු, දැති කැඩුණු සහ තදින් දින මුද්‍රා වැදුනු අයිතමයන් භාවිතා නෙකල යුතුය.
- විශේෂ හේතුවක් නොමැත්තේ නම් පාවිච්චි කල හා නොකල එකම අයිතමය එකම තැනක නොරැඳවිය යුතුය.
- ප්‍රදර්ශකය තුල භවිතා කරනු ලබන අයිතමයන් පහත අයුරු වීම වඩා යෝග්‍ය වේ.
    1- නිවැරදි තැපැල් ගාස්තුව ගෙවූ මුද්දර සහිත කවර.
    2- සාමාන්‍ය තැපෑලට වඩා ලියාපදිංචි, සීග්‍රගාමී, ගුවන් තැපැල් වැනි විශේෂ තැපැල් සේවාවන් සඳහා භාවිතාවූ කවර.
    3- විවිධාකාර මුද්දර ඇලවූ කවර වෙනුවට එකම නිකුත්කිරීමකට අයත් මුද්දර ඇලවූ කවර.
    4- මුද්දර සහ දින මුද්‍රාව අතර වැඩි සබැඳියාවක් ඇති කවර.
    5- විරල අයිතමයන්.
    6- ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය වන්නේ නම් අයිතමය සමග එහි පසුපස ඡායාපිටපත්.

4 ඉදිරිපත් කිරීම -

- දැකුම්කළු ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය.
- ප්‍රදර්ශනපත් සුදු පැහැති හෝ ලා පැහැති විය යුතුය.
- මුද්දර සහ අනෙකුත් අයතමයන් තුලනාත්මකව රැඳවිය යුතුය.
- පිටු වල විස්තර කිරීම තුලනාත්මකව කල යුතුය.
- තේමාව පරිච්ඡේද හා උප පරිච්ඡේද සඳහා විවිධ ප්‍රමාණයන්ගේ අකුරු භාවිතාකිරීම යෝග්‍ය වේ.
- ප්‍රදර්ශනපතේ මුද්‍රිත දාරය ඇතුලත පමණක් මුද්දර සහ ආශ්‍රිත ද්‍රව්‍යයන් රැඳවිය යුතුය.

වැඩි විස්තර සඳහා -


**දුරකථන** - **011 2326 163, 011 4927 248, 011 2328 301-3 දිගුව 165 හෝ 1950 ක්ෂණික ඇමතුම් සේවාව**
**වෙබ් අඩවිය** - **www.stamps.gov.lk**
**විද්‍යුත් තැපෑල** - **stamps.info@slpost.lk, slpostpb@gmail.com**
**ෆේස් බුක් පිටුව** - **https://www.facebook.com/PhilatelicBureauSriLanka/**


Prepared by Sri Lanka Philatelic Bureau